# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report
## *2022*



*ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව*

இலங்கை சட்ட உதவி ஆணைக்குழு

The Legal Aid Commission of Sri Lanka

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

# *2022*

*ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව*
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
The Legal Aid Commission of Sri Lanka

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය මගින් නීති ආධාර ලබා ගැනීම මූලික අයිතිවාසිකමක් ලෙස හඳුන්වා දී නැතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** හා **13(3)** ව්‍යවස්ථාව මඟින් ඒ පිළිබඳව අවධානයට පාත්‍ර කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** ව්‍යවස්ථාව - නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **13(3)** ව්‍යවස්ථාව - වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයෙකු මඟින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය.

තව ද 1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීති 44 රීතිය මඟින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් තහවුරු කිරීමක් සිදු කර ඇත.

**<u>සභාපතිතුමාගේ පණිවිඩය.</u>**




ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව මහජනතාව යුක්තියට ප්‍රවේශ වීමේ අවකාශය ආරම්භකර වසර හතළිස්තුනක් ගෙවා ඇති මේ අවස්ථාව පසු කරන්නේ රටත් ජනතාවත් දැඩි අභියෝගයන්ට මුහුණ දී ඇති පසුබිමකය.

කොවිඩ්-19 වසංගතය,ආර්ථිකඅර්බුදය,දේශපාලන අස්ථාවරභාවය ඇතුලු සමාජ ආර්ථික හා දේශපාලන අර්බුද විසින් ජනතාව තවදුරටත් ආන්තිකරණයට පත්කරමින් සිටින අවස්ථාවක ඔවුන්ට යුක්තියට ඇති ප්‍රවේශ ය ආරක්ෂා කිරීම සහ පුලුල් කිරීම අතිශයින් වැදගත් වේ. එහි වගකීම දරමින් සිය භූමිකාව ඉටු කිරීමට රට පුරා විසිරුණු නීති ආධාර මධ්‍යස්ථාන 85 මගින් සහ නීතිඥ මණ්ඩලයක් මගින් කටයුතු කරමින් සිටින්නේ අභියෝග රාශියක් මධ්‍යයේය.

නීති ආධාර සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් සහ යටිතල පහසුකම් නොමැති වීම ප්‍රධාන ගැටලුවක් වී ඇත. අත්‍යවශයෙන්ම සිටිය යුතු කාර්යමණ්ඩලය පවා නොමැති වීම සහ ඔවුන් බඳවා ගැනීමට පවතින සීමාවන් හේතුවෙන් පවතින නීති ආධාර මධ්‍යස්ථාන පවත්වාගෙන යාමද අභියෝගාත්මක වී ඇත. එහෙත් නීති ආධාර සේවාවන් කෙරෙහි පවතින ඉල්ලුම ඉහළ යමින් පවතින මේ අවස්ථාවේ අප සතු වගකීම ඉතා ඉහළය.

ජන සමාජයේ හෝ ජාතියක් ලෙස මුහුණදිය හැකි සියලු ආකාරයේ අභියෝගවලට මුහුණ දෙමින් වුවද, අප කාර්යමණ්ඩලය ඉතා උනන්දුවෙන් සහ වගකීමෙන් ඉටුකරන ලද සේවාවන් අගය කළ යුතුය.

පෙර වසරවල මෙන් මෙම වසරේ දී ද අධිකරණ අමාත්‍යාංශයේ නොමද සහයෝගය සහ පූර්ණ අනුග්‍රහය ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සියළු කටයුතු සඳහා ලැබීම කෘතවේදීව සිහිපත් කරමි. එය නීති ආධාර ක්ෂේත්‍රයේ ප්‍රගමනයට මහෝපකාරී විය. මේ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය ඇතුළු සියලු පාර්ශවයන්ගෙන් ලැබුණු සහයෝගය ඉතා ප්‍රශංසනීය බව සතුටින් ප්‍රකාශ කරමි.



ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු
සභාපති
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

<u>**පටුන**</u>

| | |
|---|---|
| 1. 1978 අංක 27 දරණ නීති ආධාර පනතින් සංස්ථාපිත ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව | 1 |
| 2. 1978 අංක 27 දරණ නීති ආධාර පනතේ අරමුණු | 2 |
| 3. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සංවිධාන සැලැස්ම | 3 |
| 4. 2022.12.31 දිනට නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | 4 |
| 5. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ සංයුතිය | 5 |
| 6. නීති ආධාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 6 |
| 7. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභා මධ්‍යස්ථාන ව්‍යාප්තිය | 7 |
| 8. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල ආවරණය කරන අධිකරණ | 8-10 |
| 9. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ආයතනික සංයුතිය | 11 |
| 10. නීති අංශය | 12-37 |
| 11. ව්‍යාපෘති අංශය | 38-53 |
| 12. සංවර්ධන හා කළමනාකරණ අංශය | 54 - 56 |
| 13. පරිපාලන සහ මුල්‍ය අංශය | 57- 68 |
| 14. විගණනය | 69-80 |
| 13. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථ වල දුරකථන නාමාවලිය | 81 |